# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,190 - 2020 අගෝස්තු මස 21 වැනි සිකුරාදා - 2020.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 142 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 143 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 සැප්තැම්බර් මස 11 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 අගෝස්තු මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

141 - B 82051 - 353 (2020/08)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් දොඩම්පහළ ලොකු යද්දෙහිගේ කාලිංග ප්‍රියවංශ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1985.03.21 වැනි දින ප්‍රදානය කර ඇති අංක හම්/ප්‍ර/1732 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උඩුවිල යන ලිපිනයේ පදිංචි පියපේම විජේසිරිවර්ධන වෙත ප්‍රදානය කොට හම්බන්තොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක හම්/208/296/85 යටතේ 1985.05.21 දින ලියාපදිංචි කර ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.10.02 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාගම් පත්තුවේ වීරවිල (වර්තමානයේ ගෝණගමුව) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උඩුවිල, වීරවිල නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති අංක වා. මි. ප්‍රා. සැ. දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 01 දරන පිඹුරෙහි අංක 385 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති, ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දහයක් ඇතැයි ගණන් බලා තිබෙන ගෝණගමලන්ද යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ ද නමැති රජයේ ඉඩම,

| | | |
|---|---|---|
| *උතුරට* | : | ලොට් අංක 387 දරන රක්ෂිතය ද, |
| *නැගෙනහිරට* | : | ලොට් අංක 387 දරන රක්ෂිතය සහ ලොට් අංක 385 බී දරන ඉඩම් කැබැල්ල ද, |
| *දකුණට* | : | ලොට් අංක 385 බී දරන ඉඩම් කැබැල්ල සහ ලොට් අංක 385 ඒ දරන රක්ෂිතය ද, |
| *බස්නාහිරට* | : | ලොට් අංක 385 ඒ දරන රක්ෂිතය සහ ලොට් අංක 387 දරන රක්ෂිතය වේ. |

ප්‍රාදේශීය ලේකම්,
තිස්සමහාරාමය.

2019 අගෝස්තු මස 16 වැනි දින.

08-457

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### හුඹස්ගමුව ඉඩම් ගැටලුවලට අදාළව පළ වූ 2014 සැප්තැම්බර් මස 05 අංක 1879 හා 2015 අප්‍රේල් 17 අංක 1911 දරන *ගැසට්* පත්‍ර අවලංගු කිරීම සම්බන්ධ නිවේදනය

දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිකවටන ග්‍රාම නිලධාරි වසමේ හුඹස්ගමුව ඉඩම්වලට අදාළව ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍ර 210 අවලංගු කිරීමට අදාළව පළ වූ 2014 සැප්තැම්බර් මස 05 අංක 1879 හා 2015 අප්‍රේල් මස 17 අංක 1911 දරන *ගැසට්* නිවේදන දෙක අවලංගු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

ආර්. එම්. සී. එම්. හේරත්,
ඉඩම් කොමසාරිස් ජනරාල්.

08-455

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

සබරගමුව පළාත් සභාවේ, කැගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ ආණ්ඩුකාරවරයා විසින් 1962.12.19 වැනි දින ප්‍රදානය කර ඇති අංක ආර්. 6896 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ළිඳගාව අක්කරේ ජනපදයේ පදිංචි එදිරිසිංහගේ සැමුවෙල් වෙත ප්‍රදානය කොට කැගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ආර්. 6896 යටතේ 1963.02.27 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තාවී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවක් ඇත්නම් එය 2020.09.11 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

කැගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගල්බොඩ සහ කිණිගොඩ කෝරළයේ අලුගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හේවාදිවෙල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කැගල්ල මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍ර 1 අවසාන ගම් සිතියම් අංක 127 හි කැබලි අංක 679 දරන අක්කර 0, රූඩ් 03, පර්. 31ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ළිඳගාව අක්කරේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. ග. පි. 127 හි කැබලි අංක 762 සහ TP 334669, |
| *නැගෙනහිරට* | : | අ. ග. පි. 127 හ කැබලි අංක 680, |
| *දකුණට* | : | අ. ග. පි. 127 හි කැබලි අංක 683 ජනපද මාර්ගය, |
| *බස්නාහිරට* | : | අ. ග. පි. 127 හි කැබලි අංක 678. |

ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2020 මාර්තු මස 06 වැනි දින.

08-456

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/58325.
සහකාර ඉඩම් කොමසාරිස් (කැගල්ල) ගේ අංකය : ALC/ KG/D/2/ දීබ 36.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

කැගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බිසෝවෙල, ග්‍රාම නිලධාරි වසමේ ගලිගමුව කර්මාන්තපුර භූමියේ පිහිටි සර්වේ ජනරාල් විසින් සකස් කළ කැගල්ල මැනුම් අධිකාරි භාරයේ තබා ඇති අංක 610031 දරන කැඩැස්තර සිතියමේ කලාප අංක 6 හි කැබලි අංක 151 දරන ප්‍රමාණයෙන් හෙක්. 0.0049 ක් සහ කැබලි අංක 152 වන ප්‍රමාණයෙන් හෙක්. 0.1569 වූ රජයේ ඉඩම් කොටස් පොලිතීන් බෑග් මළු නිෂ්පාදන හා මුද්‍රණය කිරීම ආශ්‍රිත කර්මාන්ත ශාලාවක් ඉදිකිරීම සහ පවත්වාගෙන යාම සඳහා ක්ලීන් පොලි පැකේජින් ප්‍රයිවට් ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ :

කැබලි අංක 151

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 150, |
| *නැගෙනහිරට* | : | මාර්ගය, |
| *දකුණට* | : | කැබලි අංක 41, |
| *බටහිරට* | : | කැබලි අංක 41. |

කැබලි අංක 152

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 41, |
| *නැගෙනහිරට* | : | මාර්ගය, |
| *දකුණට* | : | කැබලි අංක 189, 153, |
| *බටහිරට* | : | කැබලි අංක 154. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට සහ පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* :- අවුරුදු තිස් පහයි (35) (2012.07.31 සිට 2047.07.30)

*වාර්ෂික බදු මුදල* :- බදුකරයේ මුල් අවුරුදු පහ වන 2012.07.31 සිට 2017.07.30 දක්වා කාලය බද්දෙන් නිදහස්ය. ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2012 වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 50% කට නොවැඩි විය යුතු ය.

වාර මුදල. - කර්මාන්තපුර ඉඩමක් බැවින් වාර මුදලක් අය නොකෙරේ.

(ආ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

(ඈ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

(උ) 2012.07.31 දින සිට වසර (05) පහක් ගතවන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදුදීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඒ. එච්. එම්. පී. ඩී. අබේසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස් (ඉඩම්),
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 අගෝස්තු මස 21 වැනි දින,
බත්තමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

08-458

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.